1. පරිගණක යෙදුම් සඳහා බහුලව භාවිතා වන දත්ත සමුදා (Database) වර්ගය වනුයේ
(1) පැතලිගොනු (Flat file) (2) ධූරාවලි (Hierarchical) (3) ජාල (Network)
(4) සම්බන්ධක (Relational) (5) වස්තු නැඹුරු (Object oriented) **(2011, Q 7)**

2. පරිගණක දත්ත සමුදා (computerized databases) පිළිබඳව පහත දක්වෙන ප්‍රකාශ සලකා බලන්න.
A - පරිගණකගත දත්ත සමුදාය කළමනාකරණය සඳහා හස්තීය පද්ධතියකට (Manual system) වඩා වැඩියෙන් මානව සම්පත් අවශ්‍ය වේ.
B - දත්ත ආපසු ලබාගැනීම (Retrieval) හස්තීය පද්ධතියකට වඩා කාර්යක්ෂම වේ.
C - දත්ත ද්විත්වකරණ (Duplications) නොමැත.
D - දත්ත ගබඩා කිරීම සඳහා හස්තීය පද්ධතියකට වඩා ඉඩකඩ අවශ්‍ය වේ.
මනා ලෙස සැලසුම්කරන ලද දත්ත සමුදායක් සම්බන්ධයෙන් සත්‍ය වන්නේ ඉහත සඳහන් කවර ප්‍රකාශ ද?
(1) A හා B පමණි. (2) A හා D පමණි. (3) B හා C පමණි.
(4) B හා D පමණි. (5) C හා D පමණි. **(2011, Q 23)**

- අංක 3, 4, 5 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් පද්ධති විස්තරය හා A, B, C, D සම්බන්ධ (Relation) සලකන්න.
ජාතික පාසලක විදුහල්පතිවරයකුට, උසස් පෙළ සිසුන්ගේ ඇතුළත්වීමේ අංකය, ශිෂ්‍ය නාමය, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය (NIC) සහ උපන් දිනය (DOB) පවත්වා ගැනීම සඳහා දත්ත සමුදායක් සකස් කර ගැනීමට අවශ්‍ය වේ. එක් එක් විෂයය සඳහා ශිෂ්‍යයා ලබා ගත් ලකුණු ද දැනගැනීමට විදුහල්පතිවරයාට අවශ්‍ය වෙයි. ඉහත අවශ්‍යතාවලට අමතරව ගුරුවරුන්ට පවරා ඇති විෂයයන් දැනගැනීමට ද විදුහල්පතිවරයාට අවශ්‍ය වෙයි.
සම්බන්ධ (Relations) :

A – Student (admissionNo, studentName, address, DOB, NIC)
B – Subject (subjectCode, subjectName)
C – Mark (admissionNo, subjectCode, marksObtained)
D – Teacher (teacherNo, subjectCode, teacherName, SubjectName, class)

3. ඉහත දක්වෙන සම්බන්ධ අතුරෙන් 3 වන ප්‍රමත ආකෘතියෙහි (3rd Normal Form) ඇත්තේ කවරක් ද?
(1) A හා C පමණි. (2) A හා D පමණි. (3) A, B හා C පමණි.
(4) A, C හා D පමණි. (5) B, C හා D පමණි. **(2011, Q 24)**

4. පහත සඳහන් උපලක්ෂණ සංයෝජන අතුරෙන් පිළිවෙළින් ශිෂ්‍යයා (Student), විෂයය (Subject) හා ලකුණු (Mark) සම්බන්ධ පිළිබඳව අවම ප්‍රාථමික යතුරු (Primary Key) කුලකය දෙනු ලබන්නේ කුමකින් ද?
(1) admissionNo and NIC, subjectCode, admissionNo (2) NIC, subjectCode, subjectCode
(3) admissionNo, subjectCode, subjectCode (4) admissionNo, subjectCode, admissinNo and subjectCode
(5) admissionNo, subjectName, admissionNo and subjectCode **(2011, Q 25)**

5. ඇතුළත් විමේ අංකය, ශිෂ්‍යාගේ නම, විෂය, කේතය හා ලබාගත් ලකුණු අයත් ප්‍රතිදානය ඉදිරිපත් කරනු ලබන්නේ පහත දක්වෙන කවර SQL ප්‍රකාශය මගින් ද?
(1) SELECT studentName, subjectCode, marksObtained
FROM Student, Mark
WHERE Student.admissionNo = Mark.admissionNo

(2) SELECT Student.admissionNo, studentName, subjectCode, Student.marksObtained
FROM Student, Mark
WHERE Student.admissionNo = Mark.admissionNo

(3) SELECT Student.admissionNo, studentName, subjectCode, marksObtained
FROM Student, Mark
WHERE Student.admissionNo = Mark.admissionNo

(4) SELECT Student.admissionNo, studentName, subjectCode, marksObtained
FROM Student, Mark
WHERE Student.admissionNo = admissionNo

(5) SELECT Student.admissionNo, studentName, subjectCode, marksObtained
FROM Student, Mark
WHERE admissionNo = Mark.admissionNo **(2011, Q 26)**

6. ER සටහන් ඇඳීම්බඳව පහත දක්වෙන ප්‍රකාශ සලකන්න.
A - ER සටහනක භූතාර්ථ (Entities) සහ සම්බන්ධතා (Relationships) ඇත.
B - සියලු සම්බන්ධතාවල ගණනීයතාව (Cardinality) සැමවිටම එකට එක (One-to-One) විය යුතුය.
C - භූතාර්ථවලට අනුලක්ෂණ (Attributes) නිසිය හැකිය.
D - ජේවාගේ ද්විමය (Binary) සහ තෘතීය (Tertiary) සම්බන්ධතා නිසිය හැකිය.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කවර ජේවා ද?
(1) A හා D පමණි (2) B හා C පමණි. (3) B හා D පමණි. (4) A, C හා D පමණි. (5) B, C හා D පමණි. **(2011, Q 43)**

7. සම්බන්ධක දත්ත සමුදා (relational databases) පිළිබඳ ව පහත දක්වෙන කවර ප්‍රකාශය නිවැරදි වේ ද?
(1) වගුවක ප්‍රාථමික යතුර (primary key) විකල්ප යතුරු (alternate keys) අතුරෙන් තෝරා ගැනේ.
(2) වගුවක අන්‍ය යතුරක් (a foreign key) සඳහා අගයක් අනුපිටපත් කිරීම (duplicate) කළ නොහැකි ය.
(3) ප්‍රාථමික යතුරක් නොමැතිව වගුවක් නිර්මාණය කළ නොහැකි ය.
(4) වගුවක අන්‍ය යතුරක් වෙනත් වගුවක ප්‍රාථමික යතුරක් විය යුතු ය. **(2012, Q 7)**
(5) වගුවක විකල්ප යතුරු තිබිය යුතුම ය.

8. සම්බන්ධක දත්ත සමුදා (Relational Databases) පිළිබඳව පහත දක්වෙන ප්‍රකාශ සලකා බලන්න.
A - වගුවක් (table), වස්තුවක් (object) ලෙස සැලකේ
B - වගුවක දත්ත තීරුවකට (column) එම වගුවෙහි ක්ෂේත්‍රයක් (field)/උප ලක්ෂණයක් (attribute) යැයි කියනු ලැබේ.
C - වගුවක දත්ත පේළියකට (row) රෙකෝඩයක් (record) යැයි කියනු ලැබේ.
ඉහත ප්‍රකාශ අතුරෙන් කුමන ප්‍රකාශය/ප්‍රකාශ සත්‍යවේ ද?
(1) A පමණි (2) B පමණි (3) A සහ B පමණි. (4) A සහ C පමණි. (5) B සහ C පමණි. **(2012, Q 22)**


9. ER රූප සටහන් පිළිබඳව පහත දක්වෙන ප්‍රකාශ සලකා බලන්න.
A - ER රූපසටහනක සම්බන්ධතාවක් (relationship), සම්බන්ධක සමුදායක (relational database) වගුවක් (table) ලෙස ස්ථාපිත කළ හැකි ය.
B - සම්බන්ධතාවකට, එයට සම්බන්ධ වූ උප ලක්ෂණ (attributes) තිබිය හැකි ය.
C - සම්බන්ධතාවකට, භූතාර්ථ (entities) දෙකක් පමණක් සම්බන්ධ කළ හැකි ය.
ඉහත ප්‍රකාශ අතුරෙන් කුමන ප්‍රකාශය/ප්‍රකාශ සත්‍ය වේ ද?
(1) A පමණි. (2) B පමණි. (3) A සහ B පමණි. (4) A සහ C පමණි. (5) B සහ C පමණි. **(2012, Q 23)**

10. පහත දක්වෙන සම්බන්ධය (relation) සලකන්න.
student (std No, name, address, nic No, date_of _birth)
ඉහත student සම්බන්ධය මත පදනම් වූ පහත දක්වෙන කවර SQL (Structured Query Language) ප්‍රකාශය වාග් රීතිමය විශයෙන් (syntactically) නිවැරදි වේ ද?
(1) select *.* from student (2) select all from student (3) select * from student
(4) select stdNo.name from student (5) select std No; name from student **(2012, Q 24)**

11. පහත දක්වෙන සමුදා මෙහෙයුම් සලකන්න.
A - වගුවකින් රෙකෝඩ් (record) ඉවත් කිරීම
B - වගුවකට නව දත්ත එකතු කිරීම
C - වගුවක ඇති දත්ත විකරණය (modify) කිරීම
D - වගුවකින් දත්ත සමුද්ධරණ (retrieve) කිරීම
A, B, C සහ D යන දත්ත සමුදා මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමට පිළිවෙලින් ..... යන SQL ප්‍රකාශ භාවිත කළ යුතු වේ. ඉහත ප්‍රකාශයේ හිස්තැන පිරවීම සඳා පහත දක්වෙන කවර ප්‍රකාශ අනුපිළිවෙල වඩාත් සුදුසු වේද?
(1) delete, select, update සහ insert (2) delete, insert, select සහ update
(3) select, delete, insert සහ update (4) insert, select, delete සහ update
(5) delete, insert, update සහ select **(2012, Q 25)**

13. සම්බන්ධක දත්ත සමුදායක් (Relational Database) පිළිබඳව සත්‍ය වාක්‍ය පහත සඳහන් කවරක් ද?
(1) විකල්ප යතුරුවල (Alternate Keys) ඒකෑම උප කුලකයක් අපේක්ෂක යතුර (Candidate Key) ලෙස හැඳින්වේ.
(2) ප්‍රාථමික යතුර (Primary Key) තෝරා ගනු ලබන්නේ විකල්ප යතුරු අතරින් ය.
(3) ආගන්තුක යතුර (Foreign Key) යනු විකල්ප යතුරකි.
(4) සැමවිට ම සංයෝජන යතුරක් (Compound Key) සාදා ගැනීමට ප්‍රාථමික හා ආගන්තුක යතුරු සංයුක්ත කෙරේ.
(5) වගු දෙකක් අතර සම්බන්ධතාව ප්‍රාථමික හා ආගන්තුක යතුරු මගින් සිදු කරයි. **(2013,Q 27)**


14. පහත දක්වා ඇති දත්ත ගැලීම් සටහන (DFD) සලකන්න.




ඉහත දත්ත ගැලීම් සටහනේ A, B3 සහ C2 මගින් නිරූපණය වන්නේ පිළිවෙළින්
(1) ක්‍රියාවලියක්, බාහිර භූතාර්ථයක් සහ දත්ත ගබඩාවකි. (2) බාහිර භූතාර්ථයක්, ක්‍රියාවලියක් සහ දත්ත ගබඩාවකි.
(3) බාහිර භූතාර්ථයක්, දත්ත ගබඩාවක් සහ ක්‍රියාවලියකි. (4) දත්ත ගබඩාවක්, ක්‍රියාවලියක් සහ බාහිර භූතාර්ථයක්.
(5) දත්ත ගබඩාවක්, බාහිර භූතාර්ථයක් සහ ක්‍රියාවලියකි. **(2013, Q 28)**

12. පාසලක විවිධ ක්‍රීඩා ශිෂ්‍ය සහභාගිත්වය නිරූපණය කිරීමට වඩාත් ම යෝග්‍ය භූතාර්ථ සම්බන්ධතා රූප සටහන (ER diagram) වන්නේ පහත සඳහන් දෑ අතුරින් කවරක් ද?


(1)



(2)




(3)



(4)



(5)



(2013, Q 23)

15. සම්බන්ධක දත්ත සමුදා (relational databases) සම්බන්ධයෙන් පහත දී ඇති වගන්ති සලකන්න.

A - දත්ත සමුදායක ආකෘතියක සම්බන්ධතාවල තීරු පටිපාටිය වෙනස් කිරීම, යෙදුම් ක්‍රමලේඛ තුළ වෙනස්කම් ඇති කිරීමට මූලික අවශ්‍යතාවක් නොවේ.

B - දත්ත සමුදාවල ප්‍රමතකරණයේ ප්‍රධාන අරමුණු වන්නේ දත්ත සාරික්තතාව (redundancy) අඩු කිරීම යි.

C - දත්ත සමුදායට නව දත්ත එකතු කරන සෑම අවස්ථාවක දී ම පවතින ක්‍රමලේඛ වෙනස් කිරීමට සිදු වෙයි.

පහත සඳහන් දෑ අතුරින් නිවැරදි කුමක් ද?

(1) A පමණි (2) B පමණි (3) A සහ B පමණි

(4) A සහ C පමණි (5) A, B හා C සියල්ලම ය.

(2013, Q 47)

16. පහත දක්වා ඇති සම්බන්ධතා දෙක සලකන්න.

student (stdNo, name)

courseMarks (courseId, stdNo, marks)

ඉහත සම්බන්ධතා සම්බන්ධයෙන් පහත දක්වා ඇති SQL (Structured Query Language) වගන්තිවලින් වාග් රීතිවලට අනුකූල ව නිවැරදි කුමක් ද?

(1) select stdNo, marks from student, courseMarks

(2) select * from student and courseMarks

(3) selects.stdNo and c.marks from student s, courseMarks c

(4) selectstudent.stdNo, courseMarks.marks from student, courseMarks
wherestudent.stdNo = courseMarks.stdNo

(5) selectstudent.stdNo and courseMarks.marks from student and courseMarks
wherestudent.stdNo = courseMarks.stdNo

(2013, Q 50)

17. පහත සඳහන් කුමන සම්බන්ධතාව (Relation) 3 වන ප්‍රමත ආකාරයේ (3rd normal form) පවතී ද?

(1) student(studentIndexNo. name, parentName)
(2) sport(sportId, sportName, teacherName, teracherId)
(3) teacher(teacherId, teacherName, telephoneNumbermsubjectName, subjectId)
(4) book(ISBN, title)
(5) patient(patientId, patientName, ward, wardId)

(2014, Q 30)

ප්‍රශ්න අංක **18** සිට **21** දක්වා පිළිතුරු සැපයීමට සම්බන්ධතා දත්ත සමුදායක පවතින පහත පෙන්වා ඇති වගු තුන සලකා බලන්න. එක විභාගයක දී එක් විෂයයක් සඳහා එක් ප්‍රශ්න පත්‍රයක් පමණක් ඇති බව උපකල්පනය කරන්න.

subject

subjectId	title
SUB001	Information and Technology
SUB002	Chemistry
SUB003	Physics

exam


exam Id	name
EXAM001	GCE OL
EXAM002	GCE AL

examSubject


examId	subjectId	examDate
EXAM001	SUB001	2014.12.12
EXAM002	SUB001	2014.8.21
EXAM002	SUB002	2014.8.21
EXAM002	SUB003	2014.8.21

18. ඉහත දක්වා ඇති සම්බන්ධතා දත්ත සමුදායේ වගු නිරූපණය කිරීම සඳහා වඩාත් ම යෝග්‍ය භූතාර්ථ සම්බන්ධතා රූපය වන්නේ පහත රූප සටහන් වලින් කුමක් ද?


(1)




(2)




(3)



(4)



(5)



(2014, Q 31)

19. පහත සඳහන් දෑ අතුරෙන් examSubject වගුව සඳහා නිවැරදි SQL වගන්තිය පහත සඳහන් දෑ අතරෙන් කුමක් ද?

(1) examId
(2) examId, subjectId
(3) examId, examDate
(4) subjectId, examDate
(5) examId, subjectId, name

(2014, Q 32)

20. සියලු ම විභාගවල examId, name සහ examDate සමුද්ධරණය කිරීම සඳහා නිවැරදි SQL වගන්තිය පහත සඳහන් දෑ අතුරෙන් කුමක් ද?

(1) selectexamSubject.examId, name, examDate from exam, examSubject where exam.examId=examSubject.examId
(2) selectexamId, name, examDate from exam and examSubject where exam.examId=examSubject.examId
(3) selectexamId and name and examDate from exam and examSubject where exam.examId=examSubject.examId
(4) select * from exam and examSubject where exam.examId=examSubject.examId
(5) select * from exam, examSubject where exam.examId=examSubject.examId

(2014, Q 33)

21. අ.පොෂ. (උ.පෙළ) (G.C.E. AL) භෞතික විද්‍යාව (Physics) ප්‍රශ්න පත්‍රයේ පරීක්ෂණ විභාග දිනය 2014-08-25 වෙනුවට වෙනත් කිසි හැක්කක් පහත දැක්වෙන කුමන SQL විධානයිය මගින් ද?

(1) update examSubject set examDate = '2014.08.25' where subjectId = 'SUB003' or 'sub003'
(2) update examSubject set examDate = '2014.08.25' where examId = 'EXAM002' or 'subjectId='SUB003'
(3) update examSubject set examDate = '2014.08.25' where examId = 'EXAM002' and subjectId='SUB003'
(4) update examSubject set examDate = '2014.08.25' where examate = '2014.08.21'
(5) update examSubject set examDate = '2014.08.25' where examId = 'EXAM002' or subjectId = 'SUB003' or examDate='2014.08.23'

(2014, Q 34)

අංක 22 සිට 24 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු දීම සඳහා පහත දක්වා ඇති සම්බන්ධතා සලකා බලන්න.

programmer (programmerdd, programmerName, gender, NIC, mobilePhoneNumber, degree, university Name)
client (clientId, clientName, address, telephonNumber)
project (projected, project Name, clientd, startDate, endDate)
workFor (programmedd.projected, startDate, endDate)

22. පහත සඳහන් වගන්ති සලකා බලන්න.

A - දෙන ලද මොහොත අවස්ථාවක දී එක් ක්‍රමලේඛකයකු (programmer) වැඩිමනක් ලෙස එක් ව්‍යාපෘතියක (project) වැඩ කරයි.
B - එක් ක්‍රමලේඛකයකු දෙන ලද මොහොත අවස්ථාවක දී එක් සේවාලාභියෙකු (client) වෙන පරීක්ෂණ අනුප්‍රාප්ත කරයි.
C - එක් සේවාලාභියෙකු හට එක් ව්‍යාපෘතියකට වඩා පැවැතිය හැකි ය.

සැමවිට ම නිවැරදි වන්නේ ඉහත සඳහන් කවර වගන්තිය/වගන්ති ද?

(1) A පමණි (2) B පමණි (3) C පමණි (4) A හා B පමණි (5) B හා C පමණි. **(2015, Q 36)**

23. සම්බන්ධතාවල උපලැකි (attributes) සම්බන්ධයෙන් නිවැරදි වන්නේ පහත සඳහන් කවරක් ද?

(1) gender, NIC සහ mobilePhoneNumber යන උපලැකි programmer සම්බන්ධතාවෙහි අපේක්ෂිත යතුරු (candidate keys) වේ.
(2) startDate යන උපලැකිය ව්‍යුත්පන්න (derived) උපලැකියකි.
(3) NIC උපලැකිය WorkFor සම්බන්ධතාව සඳහා විකල්ප යතුරක් (alternative key) යතුරයි.
(4) StartDate උපලැකිය WorkFor සම්බන්ධතාව සඳහා ආගන්තුක (foreign key) යතුරයි.
(5) WorkFor සම්බන්ධතාවේ ඇති සෑම උපලැකියානයක ම (record) projectId භාවිතයෙන් අනනාව හඳුනාගත හැකි වේ.

(2015, Q 37)

24. පහත සඳහන් වගන්ති අතුරෙන් කවරක් නිවැරදි වන්නේ ද?

(1) සියලු සම්බන්ධතා තෙවැනි ප්‍රමත අවස්ථාවේ පවතී.
(2) programmer හැරුණු විට අනෙකුත් සියලු සම්බන්ධතා තෙවැනි ප්‍රමත අවස්ථාවේ පවතී.
(3) client හැරුණු විට අනෙකුත් සියලු සම්බන්ධතා තෙවැනි ප්‍රමත අවස්ථාවේ පවතී.
(4) project හැරුණු විට අනෙකුත් සියලු සම්බන්ධතා තෙවැනි ප්‍රමත අවස්ථාවේ පවතී.
(5) workFor හැරුණු විට අනෙකුත් සියලු සම්බන්ධතා තෙවැනි ප්‍රමත අවස්ථාවේ පවතී. **(2015, Q 38)**

25. පහත දක්වා ඇති දත්ත සමුදා සංරෝධක (constraints) සලකා බලන්න.

A - ප්‍රාථමික යතුර
B - දත්ත ප්‍රරූපය
C - ආගන්තුක යතුර

දත්ත සමුදා වගුවක, දත්ත අනුපිටපත් (duplicate) නිවීමට පරිශීලකයන්ට ඉඩ නොදෙනු ලබන්නේ ඉහත දෙවෙනි ඇති කවර සංකල්පය/සංරෝධක ද?

(1) A පමණි (2) B පමණි (3) A හා B පමණි. (4) A හා C පමණි (5) B හා C පමණි **(2015, Q 39)**

ප්‍රශ්න අංක 26 සහ 27 සඳහා පිළිතුරු සැපයීමට පහත දෙවෙනි ඇති සම්බන්ධතා දත්ත සමුදා වගු තනා සලකා බලන්න.

item table

item	product
T001	Laptop
T002	TV
T003	Camera

supplier table

supplier	name
S001	BeLap Company Ltd.
S002	DigiTV trading company

itemSupplier table

item	supplier
T001	S001
T002	S001
T002	S002

delivery table

item	supplier	batch	quantity	date
T001	S001	B01	450	1.5.2015
T002	S001	AB1	45	1.5.2015
T001	S001	B02	500	2.5.2015
T001	S002	C01	75	5.5.2015

26. "delete from item" යන SQL වගන්තිය ක්‍රියාත්මක කළ විට දත්ත සමුදාය කළමනාකරණ පද්ධතිය මගින් පහත සඳහන් කුමන ක්‍රියාව සිදුකරයි ද?
(1) පරිශීලකට ලොප් (delete) කිරීමට අවශ්‍ය කරන උපලැකියාන (records) තෝරා ගන්නා ලෙස දන්වා සිටී.
(2) 'item' වගුවේ ඇති සියලු උපලැකියාන ලොප් කිරීම සිදුවිය හැකි ය.
(3) 'item' වගුව හෙළා දමනු (drop) ලැබේ.
(4) 'item' වගුවේ කිසිදු උපලැකියානයක් ලොප් කරනු නොලැබේ.
(5) වැරදි පවතින නිසා SQL වගන්තිය ක්‍රියාත්මක නොවේ.
(2015, Q 40)

27. ඉහත වගු සම්බන්ධයෙන් පහත සඳහන් කුමක් නිවැරදි වන්නේ ද?
(1) සියලු වගු තෙවැනි ප්‍රමත අවස්ථාවේ පවතී.
(2) මෙම වගු ප්‍රමතකරණය කර ඇත.
(3) මෙම වගු සඳහා ඒකාබද්ධ සංරෝධක (integrity - constrains) නිවැරදි ව යොදා ඇත.
(4) ඒකාබද්ධ සංරෝධක නියමානුකූලව යොදාගෙන ඇති බව පැවසීමට කිසිදු සාධකයක් මෙහි නොමැත.
(5) ප්‍රමතකරණය හා ඒකාබද්ධ සංරෝධක නියමානුකූලව ආදේශ කර ඇත.
(2015, Q 41)

- අංක **28** සහ **29** ප්‍රශ්නවලට පිළිතුරු දීම සඳහා පහත දක්වා ඇති සම්බන්ධතාව සලකන්න.
book (BN, title, publisher, version, author1, author2, author3)
මෙහි BN යනු අනන්‍ය කේතයකි.

28. ඉහත සම්බන්ධතාවයේ ප්‍රමත අවස්ථාව සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) එය ශූන්‍ය ප්‍රමත අවස්ථාවෙහි පවතී (zero normal form)
(2) එය පළමු ප්‍රමත අවස්ථාවෙහි පවතී. (first, normal form)
(3) එය දෙවන ප්‍රමත අවස්ථාවෙහි පවතී (second normal form)
(4) එය තෙවන ප්‍රමත අවස්ථාවෙහි පවතී (third normal form)
(5) එහි ප්‍රමත අවස්ථාව තීරණය කළ නොහැකි ය.
(2016, Q 36)

29. පහත කවරක් ඉහත සම්බන්ධතාවයේ අපේක්ෂක යතුරක් (candidate key) විය හැකි ද?
(1) BN (2) publisher (3) version (4) author1 (5) author2
(2016, Q 37)

30. සම්බන්ධිත දත්ත සමුදායකට (relational database) අනුබද්ධව 'වසම' (domain) යන වදන සඳහා නිවැරදි වන්නේ පහත සඳහන් කුමක් ද?
(1) එය වගුවක් සඳහා ගත හැකි නාමවල කුලකයකි.
(2) එය උපලැකියක් (attribute) සඳහා ගත හැකි නාමවල කුලකයකි.
(3) එය පැවතිය හැකි ප්‍රාථමික යතුරු සියල්ලේ එකතුවයි
(4) එය උපලැකියකට පැවතිය හැකි සියලු අගයන්ගේ කුලකයකි.
(5) එය ආගන්තුක යතුරුවල එකතුවයි.
(2016, Q 38)

31. SQL වගන්තියක ප්‍රතිදානය සම්බන්ධයෙන් පහත සඳහන් කුමක් නිවැරදි වන්නේ ද?
(1) SQL වගන්තියකින් යොමු වන වගු තුළ දත්ත නොපවතී නම් එවිට දෝෂයක් උත්පාදනය වේ.
(2) එය සෑම විටම වගුවකි.
(3) ප්‍රතිදානයේ උපලැකිවල (attributes) පිළිවෙළ (පටිපාටිය) වගු නිර්වචනයේ ඇති උපලැකිවල පිළිවෙළ ම විය යුතු ය.
(4) ප්‍රාථමික යතුරු අර්ථ දක්වා නොමැති නම් ප්‍රතිදාන ලබාගත නොහැකි ය.
(5) ප්‍රතිදානයේ උපලැකිවල නාම වගු නිර්වචනයේ ඇති උපලැකිවල නාම ම විය යුතු ය.
(2016, Q 46)

32. දත්ත නිර්වචන භාෂා (DDL) වගන්තියක් භාවිතයෙන් අර්ථ දක්වා ඇති උපලැකියක දිග (length) ..... සංරෝධකයක් වේ.
පහත සඳහන් කුමක් ඉහත වගන්තියෙහි ඇති හිස්තැන පිරවීම සඳහා වඩාත් සුදුසු වන්නේ ද?
(1) ප්‍රාථමික යතුරු (2) ආගන්තුක යතුරු (3) අභිලුනය අගය (null value)
(4) වසම් (5) යෙදුම්
(2016, Q 47)

33. සම්බන්ධතා දත්ත සමුදායක ඇති පහත සඳහන් වගුව සලකන්න.

student	name	telephone	zscore
S0001	Dananjaya	0711118337	1.8
S0002	Saluka	0712227447	1.9
S0003	Upul	0713333882	2.0
S0004	Priyankara	0714445225	1.9
S0005	Supun	0715556446	2.1

ඉහත වගුවෙහි zscore උපලැකියේ සියලු අගයයන් 2.1 ලෙස යාවත්කාලීන කිරීමට අවශ්‍ය අවම SQL වගන්ති සංඛ්‍යාව කොපමණ ද?
(1) 1 (2) 2 (3) 3 (4) 4 (5) 5
(2016, Q 48)

- අංක **34** සහ **35** ප්‍රශ්නවලට පිළිතුරු දීම සඳහා පහත දක්වා ඇති සම්බන්ධතා සලකන්න.
Student (index_no, national_id_no, name, date_of_birth, gender, blood_group)
මෙහි (index_no යනු අනන්‍ය උප ලක්ෂණයක් වන අතර name උපලක්ෂණය index_no උප ලක්ෂණය මත ක්‍රියාශීලීව ම යැපෙයි (dependent) වේ.

34. ඉහත සම්බන්ධතාවයෙ ප්‍රමත අවස්ථාව සම්බන්ධයෙන් පහත දක්වෙන වගන්ති අතුරෙන් කුමක් නිවැරදි වේ ද?
(1) එය ශූන්‍ය ප්‍රමත අවස්ථාවේ පවතියි (zero normal form)
(2) එය පළමු ප්‍රමත අවස්ථාවේ පවතියි (first normal form)
(3) එය දෙවන ප්‍රමත අවස්ථාවේ පවතියි (second normal form)
(4) එය තෙවන ප්‍රමත අවස්ථාවේ පවතියි (third normal form)
(5) එහි ප්‍රමත අවස්ථාව තීරණය කළ නොහැකි ය. **(2017, Q 31)**

35. පහත කවරක් ඉහත සම්බන්ධතාවයේ අපේක්ෂක යතුරක් (candidate key) විය හැකි ද?
(1) national_id_no (2) name (3) date_of_birth
(4) gender (5) blood_group **(2017, Q 32)**

- අංක 36 සිට 39 ප්‍රශ්නවලට පිළිතුරු දීම සඳහා පහත දක්වා ඇති සම්බන්ධතා සලකන්න.

book (book_no, title, publisher, edition)

author (author_id, name, email_address)

bookAuthor (book_no, author_id)

මෙහි book_no සහ author_id පිළිවෙලින් book සහ author සම්බන්ධවල අනන්‍ය උපලක්ෂණ වේ.

36. ඉහත bookAuthor සම්බන්ධතාව පිළිබඳ නිවැරදි ප්‍රකාශ පහත දක්වෙන ඒවා අතුරෙන් කුමක් ද?
(1) book_no ප්‍රාථමික යතුර වේ.
(2) author_id ප්‍රාථමික යතුර වේ.
(3) ඕනෑම තනි උපලක්ෂණයක් අපේක්ෂක යතුරක් විය හැකි ය.
(4) author_id අපේක්ෂක යතුරක් වේ.
(5) book_no යනු ප්‍රාථමික යතුරෙහි කොටසක් වේ. **(2017, Q 33)**

37. ඉහත සම්බන්ධතා මගින් නිරූපණය කෙරෙන භූතාර්ථ අතර සම්බන්ධය නිවැරදි ව නිරූපණය කෙරෙන්නේ පහත කුමන භූතාර්ථ සම්බන්ධතා (ER) රූප සටහනින් ද?

(1)


(2)


(3)


(4)


(5)


(2017, Q 34)

38. ඉහත සම්බන්ධ, සම්බන්ධක දත්ත සමුදායක වගු බවට පත් කළේ යැයි උපකල්පනය කරන්න. පහත SQL විමසුම (query) එම දත්ත සමුදාය තුළ ක්‍රියාත්මක කරන ලදී.

SELECT * FROM bookAuthor

ඉහත SQL විමසුමෙහි ප්‍රතිදානය සම්බන්ධයෙන් පහත වගන්ති අතුරෙන් කවරක් නිවැරදි වේ ද?
(1) එය ශූන්‍ය වගුවක් (empty table) විය නොහැකි ය.
(2) එහි title තීරය (column) ඇතුළත් වේ.
(3) එහි name තීරය ඇතුලත් වේ.
(4) ප්‍රතිදානය ලබාදීම සඳහා book, author සහ bookAuthor යන වගු සියල්ල භාවිත කරයි.
(5) bookAuthor වගුවෙහි ඇති සියලු ම උපලැකි (records) ප්‍රතිදානයෙහි ඇතුළත් වේ. **(2017, Q 35)**

39. දත්ත ආරක්ෂාවය (data integrity) පවත්වා ගනිමින් bookAutor වගුව නිර්මාණය කිරීමට යොදා ගත් දත්ත නිර්වචන වගන්තිය (DDL) සම්බන්ධයෙන් පහත දක්වෙන ප්‍රකාශ සලකන්න:
A - එහි ප්‍රාථමික යතුරු සංරෝධකයක් (constraint) ඇත.
B - එහි ආගන්තුක යතුරු සංරෝධකයක් ඇත.
C - එහි වසම් සංරෝධකයක් ඇත.
ඉහත වගන්ති අතුරෙන් නිවැරදි වන්නේ,
(1) A පමණි. (2) A සහ B පමණි. (3) A හා C පමණි.
(4) B හා C පමණි. (5) A, B සහ C යන සියල්ල ම ය **(2017, Q 36)**

40. දත්ත සමුදා සම්බන්ධයෙන් පහත දක්වෙන වගන්ති සලකා බලන්න.
A - නිරූපය යතුර (candidate key) යනු, වගුවක ඇති පේළියක් අනන්‍යව හඳුනාගැනීමට උපකාරී වන තීරුවක් හෝ තීරු කිහිපයකි.
B - විකල්ප යතුර (alternate key) යනු ප්‍රාථමික යතුර (primary key) ලෙස තෝරා නොගත් නිරූපය යතුරකි.
C - ප්‍රාථමික යතුර සඳහා අභිශූන්‍ය (NULL) අගයක් තිබිය හැකි ය.
ඉහත කවර වගන්තියක්/වගන්ති නිවැරදි වේ ද?
(1) A පමණි (2) B පමණි (3) A හා B පමණි
(4) A හා C පමණි (5) A, B හා C සියල්ලම **(2018, Q 26)**

41. දත්ත ගැලීම් සටහන්වල බාහිර භූතාර්ථවලට (external entities) අදාළ පහත ප්‍රකාශ සලකන්න.
A - බාහිර භූතාර්ථ, පූර්ව අර්ථ දක්වන ලද හැසිරීම් රටාවක් ඇති පුද්ගලයකු, පද්ධතියක් හෝ සංවිධානයක් විය හැක.
B - බාහිර භූතාර්ථ ක්‍රියාවලියක් (process) සඳහා ආදාන දත්ත ප්‍රභවයක් හෝ/ සහ ක්‍රියාවලියක ප්‍රතිදාන අන්තයක් විය හැක.
C - බාහිර භූතාර්ථ සෑම විටම දත්ත ගබඩාවන් වේ.
ඉහත කවර වගන්තියක් සත්‍ය වේ ද?
(1) A පමණි (2) B පමණි (3) A හා B පමණි
(4) B හා C පමණි (5) A, B හා C සියල්ලම **(2018, Q 27)**

42. දත්ත සමුදාය පද්ධතියක පහත දක්වෙන සම්බන්ධතා පරික්‍රමාව (relational schema) සලකන්න.
Subject (SubjectID, TermID, SubjectDescription)
එහි SubjectID, TermID හා Subject Description යන දෑ..... වන අතර Subject යන්න ..... වේ.
ඉහත හිස්තැන් පිරවීම සඳහා වඩාත් ම සුදුසු වන්නේ පිළිවෙලින් පහත කවර ක් ද?
(1) උපලක්ෂණ (attributes), සම්බන්ධයක් (relation) (2) සම්බන්ධ, උපලක්ෂණයක්
(3) උපලැකියාන (tuples), සම්බන්ධයක් (4) උපලැකියාන, උපලක්ෂණයක්
(5) සම්බන්ධ උපලැකියානයක් **(2018, Q 28)**

43. දත්ත සමුදායක් පිළිබඳ පහත ප්‍රකාශ සලකන්න.
A - සම්බන්ධයක (relation) ඇති සෑම උපලක්ෂණයක් (attibute) සඳහාම එම උපලක්ෂණයෙහි වසම (domain) ලෙස හැඳින්වෙන අනුමත අගයන් කුලකයක් පවතී.
B - සම්බන්ධයක ඇති උපලැකියාන (tuples) සෑම විටම අනුපිළිවෙළකට පවතී (sorted).
C - දත්ත සමුදා පරික්‍රමාව (database schema) දත්ත සමුදායක් ගොඩනැගීමට අදාළ දත්ත නිශ්චිත සලැස්මකට (blueprint) අනුව සංවිධානය වී ඇති අයුරු පෙන්වයි.
ඉහත ප්‍රකාශවලින් කවරක් නිවැරදි වේ ද?
(1) A පමණි (2) A හා B පමණි (3) A හා C පමණි
(4) B හා C පමණි (5) A, B සහ C සියල්ලම **(2018, Q 39)**

- අංක 44 සහ 45 යන ප්‍රශ්න සඳහා පාඨ ක්ෂේත්‍රවලින් (text fields) සමන්විත පහත දක්වෙන සම්බන්ධක පරික්‍රමාව (relational schema) සලකන්න.
Students (admission_number, surname_with_initials, house_number, street_name, village, postal_town, postal_code)
දෙන ලද තැපැල් නගරයකට (postal_town) එක් තැපැල් කේතයක් (postal_code) පමණක් පවතින බව සකන්න.

44. පහත ප්‍රකාශ සලකන්න.
A - Students සම්බන්ධය ප්‍රමතකරණය (normalized) කර නැත.
B - Students යනු පළමු ප්‍රමතකරණයෙහි (First Normal Form - 1NF) පමණක් ඇති සම්බන්ධයකි.
C - ප්‍රමතකරණ අර්ථවලට අනුව Students යනු දෙවන ප්‍රමතකරණයෙහි (Second Normal Form - 2NF) හි ඇති එනයින් 1NF හි ද ඇති සම්බන්ධයකි.
ඉහත ප්‍රකාශවලින් කවරක් නිවැරදි වේ ද?
(1) A පමණි (2) B පමණි (3) A හා C පමණි (4) B හා C පමණි (5) A, B හා C සියල්ල ම **(2018, Q 40)**

45. පහත සඳහන් විමසුම ක්‍රියාත්මක කළ විට එහි ප්‍රතිදානය ලෙස කුමක් දර්ශනය වේ ද?
Select * from Students where postal_code ='10120' and house_number = '30A';
(1) සියලු ම උපලැකියානවල (records) postal_code
(2) postal_code '10120' සහ house_number '30A' ලෙස ඇති උපලැකියානවල postal_code හා house_number
(3) සියලු ම උපලැකියානවල postal_code සහ house_number
(4) postal_code '10120' සහ house_number '30A' ලෙස ඇති උපලැකියානවල සියලු ම ක්ෂේත්‍ර (fields)
(5) සියලු ම උපලැකියානවල සියලු ම ක්ෂේත්‍ර **(2018, Q 41)**


46. භූතාර්ථ සම්බන්ධතා (ER) ආකෘතිකරණය පිළිබඳ පහත දක්වෙන ප්‍රකාශ සලකන්න.
A- ගණනීයතාව (cardinality) මගින් එක් භූතාර්ථයක (entity) දෘෂ්ටාන්ත (instances) කොපමණ සංඛ්‍යාවක් වෙනත් භූතාර්ථයක එක දෘෂ්ටාන්තයකට සම්බන්ධ වේ දැයි විශේෂයෙන් සඳහන් කරනු ලැබේ.
B- භූතාර්ථයක් යනු තථ්‍ය ලෝකයෙහි (real world) ඇති අනෙක් සියලු වස්තූන්ගෙන් වෙන්කර හඳුනාගත හැකි යම් 'දෙයක්' හෝ 'වස්තුවක්' හෝ වේ.
C - ගණනීයතාව මගින් භූතාර්ථයක ප්‍රාථමික යතුරේ උපලක්ෂණ විශේෂිතව දැක්වේ.
ඉහත කවරක් නිවැරදි වේ ද?
(1) A පමණි (2) A හා B පමණි. (3) A හා C පමණි (4) B සහ C පමණි. (5) A, B හා C සියල්ලම **(2018, Q 42)**

ප්‍රශ්න අංක 47 සිට 50 පිළිතුරු සැපයීමට පහත දැක්වෙන සම්බන්ධතා (relations) සලකා බලන්න.
teacher (teacher_id, teacher_name, date_ofbirth, author_id)
book (bbok_id,book_name)
author (autor_id,author_name,email_address)
authorOfbook (author_id,publsher_name, contact_number,email)
publisherOfbook (publisher_id,book_id)
මෙහි teacher_id, book_id, author_id සහ book_id යනු පිළිවෙලින් teacher, book, author සහ publisher_id යන සම්බන්ධතා තුළ අනන්‍ය උපලැනි වේ. (unique attributes)


47. ඉහත සම්බන්ධතාවලට අනුරූපව, පහත සඳහන් කුමන වගන්තිය නිවැරදි වන්නේ ද?
(1) teacher_id යනු teacher සම්බන්ධතාව තුළ ප්‍රාථමික යතුරෙහි කොටසකි.
(2) teacher සම්බන්ධතාව තුළ author_id සඳහා NULL අගය ගත හැකිවේ.
(3) authorOfbook සම්බන්ධතාව තුළ author_id සහ book_id සඳහා NULL අගය ගත හැකිවේ.
(4) book_id යනු publisherOfbook සම්බන්ධතාවෙහි නිරුප් යතුර වේ (candidate key).
(5) author_name යනු author සම්බන්ධතාවේ තුළ නිරුප් යතුර වේ. **(Prototype Paper 2019, Q 27)**

48. පහත දක්වා ඇති භූතාර්ථ සම්බන්ධතා සටහන් (ER diagrams) අතුරින් කුමක් ඉහත දක්වා ඇති සම්බන්ධතා ඡනනය කරයි ද?


(1)




(2)




(3)



(4)



(5)



(Prototype Paper 2019, Q 28)

49. ඉහත දක්වා ඇති සම්බන්ධතා (relations) සම්බන්ධිත දත්ත සමුදායක වගු (tables) බවට පරිවර්තනය කළේ යැයි උපකල්පනය කරන්න. පහත දක්වෙන SQL විමසුම දත්ත සමුදාය මත ක්‍රියාත්මක කරනු ලැබේ.

SELECT*FROM teacher WHERE author_id is NOT NULL

ඉහත SQL විමසුමෙහි ප්‍රතිදානය සම්බන්ධයෙන් පහත දක්වෙන කවර වගන්තිය නිවැරදි වන්නේ ද?

(1) එය හිස් වගුවක් (empty table) විය නොහැකි ය.
(2) teacher සහ author වගු ප්‍රතිදානය ලබාදීමට භාවිත කරනු ලැබේ.
(3) author_name එතුල පවතී.
(4) publisher_name එතුල පවතී.
(5) teacher වගුවේ author_id උපලැකියේ කිසියම් අගයක් ඇති සියලු උපලැකියාන Records) සමඟින් වූ සියලු උපලැකියාන ප්‍රතිදානයේ පවතී.

(Prototype Paper 2019, Q 29)

50. දත්ත පූර්ණත්වය (data integrity) පවත්වා ගනිමින් publisherOfbook වගුව නිර්මාණය කර ගැනීමට භාවිත කළ දත්ත නිර්වචන භාෂාව (DDL) සම්බන්ධයෙන් වූ පහත වගන්ති සලකා බලන්න.

A - එයට ආගන්තුක යතුර සම්බාධකයක් (foreign key constrain) පවතී.
B - එයට ප්‍රාථමික යතුරක සම්බාධකයක් (primary key constrain) පවතී.
C - එයට වසමක (domain) සම්බාධකයක් පවතී.

ඉහත වගන්ති අතුරින් නිවැරදි කුමක් ද?

(1) A පමණි (2) A හා B පමණි. (3) A හා C පමණි. (4) B හා C පමණි. (5) A, B, C සියල්ලම ය.

(Prototype Paper 2019, Q 30)

51. පහත සම්බන්ධතාව සලකා බලන්න.
Student (index_no, student_name_of_birth, hobbies)
මෙම index_no යනු අනන්‍ය උපලැකියක් සහ hobbies යනු අගයන් දෙකක උපරිමයක් සහිතවිවිධ අගයන් පවතින උපලැකියකි.
ඉහත Student සම්බන්ධතාවයේ පළමු ප්‍රමත අවස්ථාව (first normal form) නිරූපණය කරන්නේ පහත සඳහන් කවර වගන්තියෙන් ද?
(i) Student(index_no, student_name, date_of_birth, hobby_1)
(2) Student(index_no, student_name, date_of_birth, hobby_1, hobby_2)
(3) Student(index_no, student_name, date_of_birth) and hobby(hobby_1, hobby_2)
(4) Student(index_no,student_name, date_of_birth) and hobby (hobby_id, hobby_1, hobby_2)
(5) Student(index_no,student_name, house_id, hobby(hobby_id, hobby_name) and student_hobby (index_no,hobby_id)
(Prototype Paper 2019, Q 31)

52. පරිශීලකයකු තමන්ගේ තනි-සකසනය සහිත පරිගණකයෙහි (single processor computer) පැතුරුම්පත් යෙදුමක් ආරම්භ කර, නව පැතුරුම් පතක් නිර්මාණය කරයි. පැතුරුම්පත සඳහා අවශ්‍ය ඇතැම් තොරතුරු ලබා ගැනීම සඳහා ඔහු තමන්ගේ දත්ත සමුදා කළමණාකරන පද්ධතිය (DBMS) භාවිත කර, විශාල දත්ත සමුදායක් විවෘත කරයි. පැතුරුම්පත සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ඔහු එය සුරකියි (save).
ඉහත පරිශීලක විසින් මෙහෙයුම් පද්ධතියෙහි පහත දී ඇති කවර අංග භාවිත කර තිබේ ද?
A - සන්දර්භ ස්විචනය (context switching)
B - ගොනු කළමනාකරණය (file management)
C - අතථ්‍ය මතකය (virtual memory)
1) A පමණි 2) B පමණි 3) A සහ B පමණි 4) A සහ C පමණි 5) A, B සහ C යන සියල්ලම **(2019, Q 11)**

- අංක 53 සිට 55 ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට පහත දැක්වෙන දත්ත සමුදා වගුව සලකන්න.

Student_Sport

Student_Id	Event_Id	Event_Name
10012	S-02	Carrom
10022	S-01	Basketball
10018	S-02	Carrom
10012	S-03	Volleyball
10025	S-04	Chess
10018	S-01	Basketball

53. ඉහත වගුව පවතින්නේ කුමන ප්‍රමත ආකාරයට ද?
1) BCNF 2) ප්‍රථම ප්‍රමත ආකාරය 3) දෙවන ප්‍රමත ආකාරය
4) තුන්වන ප්‍රමත ආකාරය 5) ශූන්‍ය ප්‍රමත ආකාරය
(2013, Q 15)

54. ඉහත වගුව පිළිබඳ පහත දැක්වෙන ප්‍රකාශ සලකන්න.
A - එයට සංයුක්ත ප්‍රාථමික යතුරක් පවතී.
B - *Event_Name* උපලැකිය *Student_Sport* වගුවෙහි ප්‍රාථමික යතුර මත පූර්ණ පරායත්ත (fully dependent) වේ.
C - *Event_Id* යනු නිරූපය (candidate) යතුරකි.
ඉහත කුමන වගන්තියක්/වගන්ති සත්‍ය වේ ද?
1) A පමණි 2) B පමණි 3) A සහ B පමණි
4) A සහ C පමණි 5) A, B සහ C සියල්ලම
(2019, Q 16)

55. *Student_Sport* වගුවට *Age* යනුවෙන් නව ක්ෂේත්‍රයක් එකතු කළ යුතු වන අතර නව ක්ෂේත්‍රයෙහි අගයයන් 10 ට වඩා වැඩි විය යුතු ය.
ඉහත අවශ්‍යතාවය ක්‍රියාත්මක කිරීම සඳහා නිවැරදි SQL ප්‍රකාශය කුමක් ද?
1) Alter table *Student_Sport add check* (*Age*> 10);
2) Alter table *Student_Sport add where* (*Age*> 10);
3) Alter table *Student_Sport set check* (*Age*> 10);
4) Update table *Student_Sport add check* (*Age*> 10);
5) Update table *Student_Sport add where* (*Age*> 10);
(2019, Q 17)

56. දත්ත හැසුරුම් භාෂාවෙහි (DML) **නොමැති** SQL විධානයක් වන්නේ පහත කුමක් ද?
1) CREATE 2) DELETE 3) INSERT 4) SELECT 5) UPDATE **(2019, Q 18)**

57. විස්තෘත භූතාර්ථ සම්බන්ධතා (EER) ආකෘතිය පිළිබඳ පහත දැක්වෙන වගන්ති සලකන්න.
A - EER ආකෘතියට මුල් ER ආකෘතියෙහි ඇති සියලු ම සංකල්ප ඇතුළත් වේ.
B - විශේෂකරණය/සාමාන්‍යකරණය (specialization/generalization) පිළිබඳ අමතර සංකල්ප EER හි පවතී.
C - දුර්වල භූතාර්ථ ආකෘතිකරණය සඳහා නව සංකල්පයක් EER හි ඇතුළත් වේ.
ඉහත කුමන වගන්තියක්/වගන්ති නිවැරදි වේ ද?
1) A පමණි 2) B පමණි 3) A සහ B පමණි 4) A සහ C පමණි 5) A, B සහ C සියල්ලම **(2019, Q 24)**

58. පහත දැක්වෙන SQL ප්‍රකාශය සලකන්න.
Update school set contact_person='Sripal W.' *where school_id*='04';
ඉහත SQL ප්‍රකාශය ක්‍රියාත්මක කිරීමේදී පහත කවරක් සත්‍ය වේ ද?
1) එය *school_id*=04 වන උපලැකියානවලට පමණක් contact_person නමින් අමතර ක්ෂේත්‍රයක් එකතු කර එම නව ක්ෂේත්‍රයට 'Sripal W.' අගය එකතු කරයි.
2) එය *school_id*=04 වන උපලැකියානවලට පමණක් contact_person යන ක්ෂේත්‍රයේ අගයට 'Sripal W.' යන අමතර අගයක් එකතු කරයි.
3) එය *school_id*=04 වන උපලැකියාන තේරීමේදී contact_person ක්ෂේත්‍ර නාමය 'Sripal W.' ලෙස වෙනස් කරයි.
4) එය *school_id* = 04 වන උපලැකියානවල (records) පමණක් contact_person යන ක්ෂේත්‍රයේ අගය 'Sripal W.' ලෙස වෙනස් කරයි.
5) එය *school_id*=04 සහ contact_person = Sripal W. ලෙස ඇති සියලුම උපලැකියාන තෝරයි. **(2019, Q 50)**